Jayathilaka, W.A. Hiranya
PAPER

# පරිසරය විෂයෙහි පැරණි ලක්දිව රජවරුන් අනුගමනය කළ සංරක්ෂණ ප්‍රතිපත්ති

ඩබ්ලිව්. ඒ. හිරණ්‍යා ජයතිලක, ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

Hiranya W.A. Jayathilaka, Department of History, University of Kelaniya

පරිසරය යනුවෙන් අදහස් කරන්නේ අප ජීවත්වන වටපිටාව හෙවත් අවට ලෝකයයි. මානවයා පරිසරයේ එක් සාධකයක් පමණි. ශාක හා සත්ත්ව ප්‍රජාව වැනි විවිධ පාරිසරික අංගවලින් ඒකාබද්ධ වූ විට පරිසර පද්ධතියක් ලෙස හඳුනාගත හැකි ය. පරිසරයෙන් තොරව මිනිසාට ජීවත්වීමට නොහැකි ය. පරිසරය මිනිසාගේ මූලික අවශ්‍යතා අතුරින් බොහෝමයක් සපුරා දෙනු ලබයි. එබැවින් මිනිසා සහ පරිසරය අතර පැවතියේ මනා සහසම්බන්ධතාවයකි.

කෙසේ වෙතත් පරිසර විනාශයට ද වඩාත් බලපා ඇත්තේ මිනිස් ක්‍රියාකාරකම් බව කිව හැකි ය. එවැනි ක්‍රියා හමුවේ පරිසරය සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව පැන නැගිණි. මේ නිසා පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම වර්තමානයේ දී සැබෑ අභියෝගයක් බවට පත්ව ඇතත් පුරාණ ලක්දිව පාලකයන් පරිසර සංරක්ෂණ ප්‍රතිපත්ති සකස් කොට, ඒවා මනාව ක්‍රියාවට නංවා ඇති බැව් පෙනේ.

පරිසරය අනාගත පරම්පරාව වෙනුවෙන් ආරක්ෂාකර තැබීමේ ප්‍රධාන ක්‍රමවේදය වන්නේ සංරක්ෂණ ක්‍රියාවලියකට භාජනය කිරීමයි. වර්තමානයේ මෙන් නොව පැරණි ලක්දිව රජවරු පරිසර සංරක්ෂණයෙහි ලා ප්‍රමුඛතාවගෙන කටයුතු කිරීමේ කිසියම් ක්‍රමානුකූලභාවයක් දක්නට ලැබිණි. සංරක්ෂණ ක්‍රියාවලියේ දී පරිසරයට හානියක් නොවන ආකාරයෙන් හා එහි ස්වාභාවිකත්වය ආරක්ෂා කර ගනිමින් රජවරු සංරක්ෂණ ප්‍රතිපත්ති සකස්කර ඇති ආකාරය හා ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. එහිදී ශාක හා සත්ව සංරක්ෂණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරිණි.

මෙහිලා පර්යේෂණ ගැටළුව වූයේ, පරිසර සංරක්ෂණය විෂයෙහි රජවරු ක්‍රියා කළ ආකාරය හා එහි දී අනුගමනය කළ ක්‍රම මොනවාද යන්නයි. ඒ සඳහා ක්‍රමවේදය ලෙස ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රය පරිශීලනය කෙරිණි.

සිංහල රජවරුන් මෙන් ම ජනයා ද පාරිසරික කටයුතු කෙරෙහි දැක්වූයේ, දැඩි සැලකිල්ලකි. බොහෝ විට පරිසරය රජවරුන්ගේ ආරක්ෂාවට පාදක වීම ඊට හේතුවන්නට ඇත. ඒ අනුව පරිසර සංරක්ෂණය රාජකීය සේවාව තුළ වූ වැදගත් කාර්යභාරයක් වූවා සේම ප්‍රමුඛතාවක් ලබා දුන් බව ද නිගමනය කළ හැකි ය. තව ද පරිසරය සංරක්ෂණයෙහිලා උපක්‍රම වශයෙන් නීති සම්පාදනය හා අණපනත් නිර්මාණය කළ බව ද හඳුනාගත හැකි ය.

මුඛ්‍ය පද- සංරක්ෂණය, පරිසරය, ශාක